**ගොවීන්ගේ ඕනෑ එපාකම් නියෝජනය කළහැකි වන පරිදි නිලධාරීන් හා ගොවීන් අතර කිට්ටු සම්බන්ධය වඩා හිතකර ජල පාලනයක් සඳහා අතිශයින්ම වැදගත් වන්නේය.**

# මහා ජල පාලනයකදී සැලකියයුතු අංග

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී එච්. ඒ. රන්බණ්ඩා විසිනි.

ආසියාතික රටවල වාරි මාර්ග කටයුතුවල නියුතු වූවන් අතර ක්‍රමවත් ජල කළමණාකරණයක ඇති වැදගත් කම දැඩි සැලකිල්ලට යොමුව පවතී. වඩාහොඳ ජල පාලනයක් මගින් ගොවීන්ට වී පැලයේ කුඩා අවධියේ සිට අස්වැන්න නෙලන තුරු කිසිම ජල හිඟයකින් තොරව වී වගා කළ හැකි වනවාක් මෙන් ම වසරකට කන්න දෙකක් නො කඩවා වී වගාකිරීමට ඇති හැකියාව ද සහතික කරයි. වාරිමාර්ග පද්ධතිය ක්‍රියා කරවන්නන් වඩා හොඳ ජල පාලනයක් යනුවෙන් අදහස් කරන්නේ අධික ජල භාවිතය හා වහනයේ දී සිදු වන අධික ජල නාස්තිය ද වලකා ජල ඒකකයකින් උපරිම අස්වැන්නක් ලැබිය හැකි පරිදි අරපරෙස්සම ප්‍රධානකොට ගත් ක්‍රමානුකූල ජල භාවිත යෙකි. දැනටමත් වගාවට යොදගෙන ඇති ඉඩම් සඳහා ජලය අඩුවෙන් පරිහරණය කිරීම මගින් වගාව සඳහා අළුතින් ඉඩම් යොද ගැනීම පහසු කෙරෙන අතර, ක්‍රමවත් ජල පාලනයක් මගින් ජල හිඟයෙන් නිරතුරුව සිදුවන අස්වනු පාලු වළකා ගත හැක. මේ අනුව වඩා හොඳ ජලපාලනයක මූලික අරමුණ වනුයේ අක්කරයක සාමාන්‍ය ඵලදාව හා වගා කළ හැකි ප්‍රමාණය යන දෙක ම වැඩි කරලීමෙන් සමස්ත නිමවුමේ වර්ධනයක් ඇති කරලීමයි.

**ජලය උපරිම අයුරින් ප්‍රයෝජනයට නො ගැනෙන බවට සාක්ෂි එමටය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කරන ලද පර්යේෂණයක් අනුව වියලි කලාපීය ඉඩම් වල මහ කන්නයේ සාර්ථක වගාවක් සඳහා අක්කරයකට වාරි ජලය අක්කර අඩි 3 ක් ද ,යල් කන්නය සඳහා අක්කර අඩි 5 ක් ද ප්‍රමාණවත් වේ. එහෙත් වියළි කලාපීය වැව් 15 ක් ආශ්‍රිතව කරන ලද පර්යේෂණයක් අනුව ඇත්ත වශයෙන්ම මහ කන්නයේ අක්කරයක් සඳහා භාවිතා කෙරෙන වාරි ජලය අක්ක්කර අඩි 5 ක්ද, යල කන්නය සඳහා අක්කර අඩි 7 ක් ද ලෙස ඇස්තමේන්තු කොට ඇත.** අධි ජල පරිහරණය නිසා මහ කන්නයේ වගා කළ හැකි මුළු බිම් ප්‍රමාණය වගා කළ නො හැකි වන අවස්ථාවේ දී විශේෂයෙන් මහ කන්නය අවසානයේ ඇතිවන ජල හිඟය අස්වනු විනාශයට හේතුවන අතර, යල කන්නයේ වගා කළ හැකි බිම් ප්‍රමාණය අඩකටත් වඩා අඩු කරලීමට හේතු වී ඇත.

## ජලය අපතේ යන්නේ ඇයි?

වියලි කලාපිය විශාල වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි මෙම අති විශාල ජල භාවිතය සඳහා හේතු සාධකයන් කිහිපයක් පහත සඳහන් වෙයි.

(1) බීජ වපුරන කාල සීමාව මාස 2 හෝ 3 කට වඩා කාලයක් දක්වා දීර්ඝ වීම. මෙනිසා බිම් සකස් කිරීම සඳහා අවශ්‍ය වන ජලය නිකුත් කිරීම ඉතා අධික වේ. (බීජ වැපිරීම දක්වා කාල සීමාව මසකට වඩා දීර්ඝ විය යුතු නොවේ.)

(2) අතින් වල් ඉදිරීම හෝ වල් නාශකයන් යෙදීම හෝ වෙනුවට ලියදි වල ජලය රඳවා තබා එමගින් වල් මර්ධනයට ගොවීන් උත්සාහ කිරීමෙන් නිරපරාදේ ජලය නාස්ති වීම.

(3) ජලය නීති විරෝධී ලෙස හරවා ගැනීමෙන් ජලය අධික ලෙස අපතේ යෑම.

(4) ඇල මාර්ග ඔස්සේ ඇතුළු කාන්දු වීමෙන් අධික ලෙස ජලය නාස්ති වීම.

(5) කුඹුරු වේලි නඩත්තු නො කිරීමෙන් විශාල වශයෙන් ජලය අපතේ යෑම.

(6) වී වගාව සඳහා පාරගම්‍ය පස යොදා ගනු ලැබීම නිසා ජල භාවිතය අධික වීම.

(7) ජලය බෙදා හරින ඇල මාර්ගයන් නිසියාකාරව නඩත්තු නො කිරීම, ඇල ඉවුරු සේදී ගොස් රොන් මඩ වලින් පිරී යාම, සහ ජල හැරවුම් හා පාලන දොරටු කඩා බිඳ දමා තිබීම නිසා ජලය බෙදා හැරීම නිසියාකාරව පාලනය කළ නොහැකි වීම යන හේතු මත ජලය අධික ලෙස අපතේ යාම.

බොහෝවිට වාරිමාර්ග යෝජනා ක්‍රම සැලසුම් කිරීමේ දී සැලකිල්ලට භාජනය කොට ඇත්තේ ශිල්පීය සාධකයන් පමණක් වීම හා සමාජීය කරුණු පිළිබඳ එතරම් සැලකිල්ලක් නො දැක්වීම අකාර්යක්ෂම ජල පාලනයක් ඇතිවීමෙහිලා හේතු භූත වූවා වියහැක. මේ අනුව ශිල්පීය සාධකයන් මෙන් ම සමාජීය සාධකයන් ද ක්‍රමවත් ජල පාලනයක් සඳහා සැලකිල්ලට ගත යුතු වේ. එක් ප්‍රධාන ශිල්පීය සාධකයක් ලෙස දියුණු ජල සැපයුම් ව්‍යුහයක පැවැත්ම සැලකිය හැක. ඇලවේලි වල ක්‍රමවත් පිහිටීම හා නිර්මානය ජලය ක්‍රමානුකූලව බෙදා හැරීම සම්බන්ධව හිතකර විය යුතු ය.

දියුණු ඉංජිනේරු ශිල්පීය ක්‍රමයන්ට පටහැනිව සකස් වූ ඇලමාර්ග ඔස්සේ ජලය මනා ලෙස බෙදා හැරිය නො හැකි වන්නට පුළුවන. මේ අනුව, දියුණු ජලප්‍රවාහන පද්ධතියක් පැවැත්ම කාර්යක්ෂම ජල භාවිතයක් සඳහා අත්‍යාවශ්‍ය අංගයකි. එමෙන්ම දියුණු ඉංජිනේරු ශිල්පීය ක්‍රමයක් අනුව ඇල මාර්ගයන් සැලසුම් කළ ද සමාජීය අංශයන් පිළිබඳව පවා අවධානය යොමු නො කළ හොත් එය අසාර්ථක එකක් විය හැක. උදාහරණයක් දක්වතොත් ගොවීන් අතර සහභාගිත්වය පළුදුවන අයුරු සැලසුම් කරණ ලද වාරිමාර්ග ව්‍යුහය දුර්වල එකක් වන්නට පුළුවන. කිසියම් යෝජනා ක්‍රමයක ප්‍රධාන ඇල මාර්ගයන් ගෙන් කෙළින් ම ජලය ලබා ගත හැකි ගොවීන් ද, වේලි ඇල මාර්ග වලින් පමණක් ජලය ලබා ගත හැකි ගොවීන් ද සිටීම ගොවි සංවිධාන ඇති කරලීමේ දී ගැටළු ඇති කොට තිබේ. එමෙන්ම එක් එක් වෙල් ඇල මාර්ග වලින් ජලය ලැබිය හැකි ගොවීන් ගණන අඩු වැඩි වීමද ගොවි සහභාගිත්වය දුර්වල කරන්නක් විය හැක.

### ජල පාලනයට බලපාන සාධක

ශෂ්‍ය විද්‍යාත්මක හා පාංශු සාධක ද ශිල්පීය වශයෙන් ජල පාලනයට බලපාන සාධකයන් ලෙස සැලකිය හැක. උදාහරණ ලෙස, ජලය හිඟ යල් කන්නයේ දී ජල ඒකකයට ලැබිය හැකි ආර්ථිකමය වාසි වී බෝගයට වඩා, වෙනත් අතුරු බෝගයන් සම්බන්ධයෙන් විශාල විය හැක. මේ අනුව බෝග තෝරා ගැනීමේ දී පවත්නා ජල සැපයුම් පද්ධතිය හා එක් එක් බෝගයන්හි ජල පරිභෝජන රටාව මෙන් ම පාංශු සාධක ද සැලකිල්ලට ගැනීම ක්‍රමවත් ජල පාලනයක් සඳහා හිතකර වේ.

ක්‍රමවත් ජල පාලනයක් සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස සමාජවිද්‍යාඥයින් විසින් නිර්දේශ කරනු ලබන්නේ ගොවීන්ගේ සහභාගිත්වයයි. අධික ජල නාස්තිය, ඇලවේලි ක්‍රමානුකූලව නඩත්තු නො කිරීම, නීති විරෝධී මාර්ගයන්ගෙන් ජලය ලබා ගැනීම ආදී ක්‍රියාවන්ට හේතු වී ඇත්තේ ජලය බෙදා හදා ගැනීම පිළිබඳ ව ක්‍රමවත් ගොවි සංවිධාන නොතිබීමය, යන්න ඔවුන්ගේ මූලික අදහසයි. කෙසේ වෙතත් ගොවි සංවිධාන ඇති කිරීමේ දී වුව ද මූලික වශයෙන් ජල සැපයුම සහතික විය යුතුය. එමෙන්ම සෑම වාරිමාර්ග ක්‍රමයක් සඳහාම එකම අයුරින් යොදා ගත හැකි "ගොවි සංවිධානයක්" ගැන කථා කිරීම අනුවන කමකි. එහි ස්වරූපය සංයුතිය හා වගකීම අවශ්‍යයෙන් ම වාරිමාර්ග ව්‍යුහය මෙන් ම ජනසමාජය ද හා අනුරූපී විය යුතුය.

ජලය පාලනය කරන්නන් මෙන් ම ජලය භාවිතා කරන්නන් (ගොවීන්) අතර මනා සම්බන්ධය ද ක්‍රමවත් ජල පාලනයක් සඳහා අත්‍යවශ්‍ය එකකි. ප්‍රායෝගිකව මෙම සබන්ධතාවය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජල සම්පාදන යෝජනා ක්‍රම වල දැකිය නොහැක්කකි. බොහෝවිට ජලය බෙදා හැරීම පිළිබඳව තීරණ ගනු ලබන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා වෙනත් දෙපාර්තමේන්තු කිහිපයක නිලධාරීන් විසිනි. ජලය භාවිතාකරන ගොවීන්ගේ අවශ්‍යතා මින් නියෝජනය නොවේ. ජලය බෙදාහැරීම හා වගා කාල සටහන පිළිබඳ තීරණයක් ගනු ලබන 'කන්න' රැස්වීම සඳහා ගොවීන්ගෙන් ඉතාම සුළු පිරිසක් පමණක් සහභාගීවන බව නිතර අසන්නට ලැබෙන්නකි. කන්න රැස්වීම්වල තීරණයන්

(30 වන පිටුවට)

(29 පිටුවෙන්)

කෙරෙහි එකඟ වෙනවා හැර ඒ පිළිබඳව කිසිම ආකාරයක බලපෑමක් කළ නො හැකි නම් සහභාගි නොවී සිටීමෙන් ගොවීන් තර්කානුකූලව කටයුතු කළා විය හැක.

ජල සැපයුම්' තීරණ වල දී ගොවීන් ගේ ඕනෑ එපාකම් නියෝජනය කළ හැකි වන පරිදි නිලධාරීන් හා ගොවීන් අතර කිට්ටු සම්බන්ධය වඩා හිතකර ජල පාලනයක් සඳහා අතිශයින්ම වැදගත් වනු ඇත.



මේ අනුව කෘෂිකාර්මික ජල භාවිතය කාර්යක්ෂම කරවීමේ ප්‍රයත්නයක දී ඊට බලපාන සියළු සාධකයන් කෙරේ අවධානය යොමු කරවීම වැදගත් ය. ඒමෙන්ම ඒ සියල්ල ප්‍රමාණවත් අයුරු ආවරණය වන ඒකාබද්ධ ක්‍රියාවලියක් තුළින් ක්‍රමවත් ජල පාලනයක් අරමුණු කරනවා විනා, එක් අංශයක් පිළිබඳ ව පමණක් යොමු වූ වැඩ සටහනක් මගින් කාර්යක්ෂම ජල පාලනයක් අපේක්ෂා කළ නො හැක.